# පුවත් හසුන

## උක් පර්යේෂණ ආයතනය

වෙළුම 03 කාණ්ඩය 01 ජුනි 2008

# සුදු පත්‍ර රෝගයට ඔරොත්තුදෙන නව උක් ප්‍රභේදයක් එස්.එල්.92-5588

උක් වගාවේ සුදු පත්‍ර/තෘණාකාර කුරුවීමේ රෝගයට (GSD/WLD) ඔරොත්තු දෙන නව උක් ප්‍රභේදයක් එස්.එල්. 92-5588 නමින් හඳුන්වා දීමට උක් පර්යේෂණ ආයතනය සමත් වෙයි. උක් වගාවේ සුදු පත්‍ර/තෘණාකාර කුරුවීමේ රෝගයට අඩු පාත්‍රීයතාවයක් පෙන්වූ එස්.එල්. 8306 ප්‍රභේදයට වඩා එම රෝගයට ඔරොත්තු දීමේ හැකියාවක් ඇති මෙම උක් ප්‍රභේදය සියලුම උක් වගා ප්‍රදේශ සඳහා යෝග්‍ය වන අතර දැනට වාණිජ වගාවන් සඳහා භාවිතා වන වර්ග වලට සාපේක්ෂව සීනි හා උක් අස්වනු අතිශ්‍ය ඉහළ මට්ටමක පවතී. උක් පර්යේෂණ ආයතනීය අභිජනන අංශය මගින් වානිජ වගාවන් සඳහා හඳුන්වා දීමට යෝග්‍ය බවට මූලික පර්යේෂණ මගින් හඳුනාගෙන ඇති ප්‍රභේද අතුරින් එකක් වන එස්.එල්. 92-5588 ප්‍රභේදය, ආයතනීය උක් අභිජනන වැඩසටහන් යටතේ විවිධ ප්‍රාදේශීය තත්වයන් තුල ඇගයීමට ලක්කර, මේ වන විට උක් ගොවි කළමණාකරණය යටතේ තවදුරටත් ඇගයීමට ලක් වෙමින් පවතී.

සුදු පත්‍ර/තෘණාකාර කුරුවීමේ රෝගය, සියලුම උක් වගා කරන ප්‍රදේශ වලටද පැතිර දැනට උක් කර්මාන්තයේ සංවර්ධනයට විශාල තර්ජනයක් බවට පත්ව ඇති අතර රෝගය වැළඳුනු වගාවන් වල උක් අස්වැන්න හා උක් ගස් වල සීනි ප්‍රතිශතය ඉතා විශාල වශයෙන් අඩු වීමත්, සීඝ්‍ර ලෙස රෝගය ව්‍යාප්ත වීමත් හේතුවෙන් උක් ගොවීන් හා සීනි කර්මාන්තායතන දැනට මුහුණ දී සිටින ගැටළු වල ප්‍රධාන සාධකයක්ව පවතී. රෝග පාලනය සම්බන්ධව මෙතෙක් ගෙන ඇති පියවර අධ්‍යයනය කිරීමේදී රෝග කාරකය හා රෝගය පතුරුවන කෘමියා පාලනය කිරීමට රසායනික ක්‍රම හා ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලන ක්‍රම යොදා ගැනීමේ හැකියාව සීමාසහිත වන බැවින් දැනට උක් පර්යේෂණ ආයතනය මගින් නිර්දේශිත ඒකාබද්ධ රෝග පාලන වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා රෝගයට ඉහළ ඔරොත්තු දීමේ හැකියාවක් ඇති නව උක් ප්‍රභේදය ඉතාමත් ප්‍රයෝජනවත් වනු ඇත.






උක් පර්යේෂණ ආයතනයේ 2008 පර්යේෂණ වැඩ සටහන් සමාලෝචන රැස්වීම අතිරේක වැවිලි බෝග සංවර්ධන අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් උඩවලවේදී

## ඇතුලත පිටු


- උක් කර්මාන්ත තොරතුරු
  - සෙවනගල ගොවි ගැටළු අතිරේක වැවිලි බෝග සංවර්ධන ඇමතිතුමාගේ අවධානයට
  - පැල්වත්ත ගොවි ගැටළු වලට විසඳුම් සෙවීමට පියවර
  - වූල් කූඩිත්තා පාලනයට සෙවනගලින් ගොවි නායකයින් 150 ක්
  - බිබිල ප්‍රදේශයට උචිත උක් ප්‍රභේද අත්හදා බලයි
  - හිඟුරානට උක් පර්යේෂණ ආයතනයෙන් බීජ උක්
- පර්යේෂණ හා ව්‍යාප්ති තොරතුරු
  - ලවණ අධික උක් ඉඩම් පුනුරුත්තාපනයට උපදෙස්
  - ඩයිපා බෝකර උක් බිම් වලට මුදාහරී
  - නව උක් ප්‍රභේද පැල්වත්තේ ගොවි බිම් තුලට
  - උක් සමග අතුරු බෝග ක්ෂේත්‍ර ආදර්ශන
  - වූල් කූඩිත්තාගෙන් හානි වූ පස්සර ගොවි බිම්
  - යළි සංවර්ධනය වේ.
- ආයතන තොරතුරු
- සීනි නිශ්පාදනය පිළිබඳ වර්තමාන තොරතුරු
- උක් ගස ජෛව කම්හලක් බවට.............

## සෙවනගල ගොවි ගැටළු අතිරේක වැවිලි බෝග සංවර්ධන ඇමතිතුමාගේ අවධානයට

සෙවනගල උක් ගොවි මහතුන් මුහුණ දී ඇති ගැටළු සම්බන්ධව විශේෂ සාකච්ඡාවක් අතිරේක වැවිලි බෝග සංවර්ධන අමාත්‍ය ගරු ධර්මදාස බණ්ඩා මහතාගේ ප්‍රධානත්වයේන් අතිරේක වැවිලි බෝග සංවර්ධන අමාත්‍යංශයේදී අප්‍රේල් මස 02 වන දින පැවැත්වීමට එම අමාත්‍යංශය පියවර ගෙන තිබුනි. සෙවනගල සීනි සමාගම, උක් පර්යේෂණ ආයතනය, අමාත්‍යංශ නිළධාරි මහතුන් හා ගොවි නියෝජිත මහතුන්ගේ සහභාගිත්වයෙන් පැවති මෙම සාකච්ඡාවේදී වුල් කුඩිත්තාගේ හානිය පාලනය කිරීම, පළිබෝධ නාෂක යෙදීම සඳහා වියදම් දැරීම පිළිබඳව, හා අස්වනු නෙලීමේ ගැටළු වලට විසඳුමක් ලෙස පොකුරු වගා බිම් ඇති කිරීමේ හැකියාව ගැන අවධානයට ලක් කර ඇත.

## පැල්වත්ත ගොවි ගැටළු වලට විසඳුම් සෙවීමට පියවර

දිනෙන් දින ඉහළ යන අමුද්‍රව්‍යය මිළත් තරඟකාරි ලෝක සීනි මිළත් මෑත කාලයේදී උක් කර්මාන්තයට විශාල ලෙස බලපා ඇති රෝග හා පලිබෝධ ව්‍යාප්තියත් හමුවේ දැඩි දුශ්කරතාවයන්ට මුහුණ දී සිටින උක් ගොවි මහතුන්ගේ ගැටළු අවධානයට ගනිමින් එම තත්වයට විසඳුම් සෙවීමට පැල්වත්ත සීනි සමාගම පියවර ගෙන ඇත. ඒ අනුව ගොවි ගැටළු වලට විසඳුම් ලෙස පැල්වත්ත සීනි සමාගම මගින් යෝජිත වැඩසටහන් පිළිබඳව උක් ගොවි මහතුන් දැනුවත් කිරිමට විශේෂ ගොවි හමු ජනාවාස හා පිටස්තර ගොවි ප්‍රදේශ බෝහෝමයක් ආවරණය කරමින් මෙම වසරේ පළමු කාර්තුව තුළ පැවැත්වීමට එම ආයතනය පියවර ගෙන තිබුණි. සීනි සමාගමේ නිළධාරී මහතුන් හා ගොවි මහතුන්ගේ සහභාගිත්වයෙන් පැවැති මෙම ගොවි හමු වලට උක් පර්යේෂණ අයතනයේ පර්යේෂණ හා ව්‍යාප්ති නිළධාරින්ද සහභාගී විය. පැල්වත්ත සීනි සමාගම විසින් යෝජිත ගොවි සහන පිළිබඳව දැනුවත් කිරීමත් ඒ සම්බන්ධව ගොවි මහතුන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමත් වගා පාලනය සම්බන්ධව ගොවි මහතුන් මුහුණ දී ඇති ගැටළු වලට උපදෙස් ලබා දීමත් මෙහිදී සිදු කෙරුණි.

## වූල් කූඩිත්තා හානිය හා අස්වනු නෙලීමේ ගැටළු වලට විසඳුම් සෙවීමට සෙවනගලින් ගොවි නායකයින් 150 ක්

වර්ථමානයේ උක් ගොවීන් මුහුණ දී ඇති ගැටළු සාමූහිකව විසඳා ගැනීමට සෙවනගල උක් කර්මාන්තායතනය සැරසෙයි. මේ අනුව දැනටමත් උක් ගොවි මහතුන්ගේ සහයෝගය තුලින් වූල් කූඩිත්තාගේ තර්ජනයට මුහුණ දීමටත් උක් නෙලීම ඇතුළු ගැටළු වලට විසඳුම් සොයා ගැනීම උදෙසාත් විශේෂ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට සෙවනගල සීනි කර්මාන්තායතනය පියවර ගෙන ඇත. මේ සම්බන්ධව ගොවි නායකයන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් 2008 මැයි මස 26 දින සෙවනගල සීනි කර්මාන්තායතනය තුළදී පැවැති අතර මෙම අවස්ථාවට තෝරා ගත් ගොවි නායක මහතුන්, සීනි කර්මාන්තායතන නිලධාරී මහතුන් හා උක් පර්යේෂණ ආයතනයේ නිලධාරී මහතුන්ද සහභාගී විය.

## බිබිල ප්‍රදේශයට උචිත උක් ප්‍රභේද අත්හදා බලයි.

යෝජිත බිබිල සීනි කර්මාන්ත සංවර්ධන වැඩසටහනට අදාලව වර්ෂාපෝෂිත තත්වයන් යටතේ එම ප්‍රදේශයට උචිත උක් ප්‍රභේද හඳුනා ගැනීමේ වැඩ සටහනක් උක් පර්යේෂණ ආයතනය විසින් ක්‍රියාත්මක කර ඇත. මෙහි මූලික පියවරක් ලෙස මැදගම ප්‍රදේශයේ දැනට වානිජ වගාවන් සඳහා උක් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශිත උක් ප්‍රභේද 16 ක් යෙදූ පර්යේෂණ ක්ෂේත්‍රයක් උක් පර්යේෂණ ආයතනීය අභිජනන අංශය මගින් ස්ථාපනය කර ඇත.

## හිඟුරානට උක් පර්යේෂණ ආයතනයෙන් බීජ උක්

දැනට සී.ස. ගල්ඔය ප්ලාන්ටේෂන් සමාගම යටතේ සංවර්ධනය වන හිඟුරාන ප්‍රදේශයේ උක් වගා තවාන් සඳහා බීජ උක් සැපයීමට උක් පර්යේෂණ ආයතනය පියවර ගෙන ඇත. මේ අනුව දැනට උක් පර්යේෂන ආයතනයේ ගොවිපල තුල නිපද වූ එස්. එල්. 8306 ප්‍රභේදයේ බීජ උක් ටොන් 250 ක් පමණ එම ප්‍රදේශයට ලබා දී ඇත.

## දැයට කිරුළ 2008 ප්‍රදර්ශන භූමිය තුල අතිරේක වැවිලි බෝග සංවර්ධන අමාත්‍යංශ ප්‍රදර්ශන කුටියට උක් පර්යේෂණ ආයතනයත්

ඉදිරි සංවර්ධන සැලසුම් හා ලබා ඇති ප්‍රගතිය සංවර්ධන මාවතක් තුලින් නිරූපණය කරමින් මෙවර බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රන ශාලා භූමියේ පැවති දැයට කිරුළ 2008 ප්‍රදර්ශනයේ අතිරේක වැවිලි බෝග සංවර්ධන අමාත්‍යංශ ප්‍රදර්ශන කුටියට උක් පර්යේෂණ ආයතනයත් එක් විය. අතිරේක වැවිලි බෝග සංවර්ධන අමාත්‍යංශයේ මග පෙන්වීම යටතේ නිර්මාණය වූ ප්‍රදර්ශන කුටිය තුළ උක් කර්මාන්ත සංවර්ධන මං පෙත් වලට අමතරව උක් සමග අතුරු බෝග යොදා ගැනීම හා ජෛව ඉන්ධනයක් ලෙස එතනෝල් යොදා ගැනීමද අවධාරනයට ලක් කර තිබුණි.

# ලවණ අධික උක් ඉඩම් පුනරුත්තාපනයට උක් පර්යේෂණ අයතනයෙන් උපදෙස්


පැල්වත්ත කේන්ද්‍රිය වතුයායේ ලවණ අධික වීමෙන් නිසරු වූ උක් බිමක් .....

පැල්වත්ත සීනි සමාගම තුළ කේන්ද්‍රිය වතුයාය හා ජනාවාස ප්‍රදේශ ආශ්‍රිතව නිසරු තත්වයට පත්වූ වගා බිම් වල ලවණ මට්ටම් නිර්ණය කිරීමටත් එම ඉඩම් පුනරුත්තාපනය කිරීම උදෙසා ගත යුතු ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීමටත් උක් පර්යේෂණ ආයතනය පියවර ගෙන ඇත. උක් පර්යේෂණ ආයතනීය රසායන විද්‍යා අංශය, පැල්වත්ත සීනි සමාගමේ ශෂ්‍ය විද්‍යා අංශයේ සහාය ඇතුව වසර දෙකක පමණ කාලයක් තුල ලවණ අධික වීමෙන් නිසරු තත්වයට පත් වගා බිම් ආශ්‍රිතව පසේ පී.එච්. අගය, විද්‍යුත් සන්නායකතාව, සෝඩියම්, කැල්සියම්, මැග්නීසියම්, කැටායන හුවමාරු ධාරිතාව හා හුවමාරු කළ හැකි සෝඩියම් ප්‍රමානය (ESP) අගයන් අධ්‍යයනය කිරීමෙන් මෙම ලවණතාවය සෝඩික් තත්වයක් වන බව හඳුනාගෙන ඇති අතර, එමෙන්ම ලවණ අධික ප්‍රදේශ හඳුනා ගැනීමටත් ලවණතාවයන් නිර්ණය කිරීමටත් කටයුතු කර ඇත.

මෙසේ ලවණ අධික වීම හේතුවෙන් නිසරු වූ ක්ෂේත්‍ර පුනුරුත්තාපනය කර කළමනාකරණය කිරීමට උක් පර්යේෂණ ආයතනය පහත නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

01. කාබනික ද්‍රව්‍ය භාවිතය: හෙක්ටයාර 1 කට වියෝජනය වූ පෙරහන් මඩ ටොන් 100 ක් පමණ එකතු කිරීම හා වගා බිමේ ඉතුරුවන උක් රොඩු සියල්ලම පස සමග හොඳින් කලවම් කිරීම.
02. ද්‍රාව්‍ය ලවණ පස තුලින් පහළට කාන්දු වී පසෙන් ඉවත්වීම පහසුකිරීම සඳහා ජල වහන කාණු සකස්කර පාංශු ජල මට්ටම පහළ දැමීම.(මේ අනුව පවතින දිය අගල් මීටර් 02 ක් පමණ පළලට හා මීටර් 1.5 පමණ ගැඹුරට 900:1 පමණ බෑවුමක් සහිතව සැකසීම.)
03. සෝඩියම් ලවණ සේදී ඉවත් වීම සඳහා 320 ppm (මිලියනයකට කොටස්) ලවණතාවය නොඉක්මවන ජලය සම්පාදනය කිරීම.
04. ඉහත නිර්දේශ තුලින් ඉක්මන් ප්‍රතිඵල නොලබන අවස්ථාවන්හි හෙක්ටයාර එකකට ජිප්සම් ටොන් 5 - 8 ප්‍රමාණයෙන් පසට එකතු කිරීම.

ඉහත නිර්දේශ ක්‍රියාත්මක කරන අතරතුර පිලිපැදිය යුතු අනෙකුත් උපදෙස්:

- ලවණ අධික වීම හේතුවෙන් නිසරු වූ ක්ෂේත්‍ර සඳහා යූරියා පොහොර වෙනුවට ඇමෝනියම් සල්ෆේට් භාවිතා කිරීම.
- වියලි කාල වලදී ලැබෙන් සුළු වැසි හේතුවෙන් ලවණ සේදී ශාක මූලට එකතුවීමෙන් ශාක මූල් පද්ධතියට හානි වීම වැළැක්වීම සඳහා එම කාලතුල අතිරේක ජල සම්පාදනය කිරීම.
- බිම් සැකසීමේදී හොඳින් පොළව ඒකාකාර ලෙස මට්ටම් කිරීම හා සමෝච්ඡ ක්‍රමයට බෑවුම 0.5 - 0.8 % වන ලෙස ඇලි වැටි සකසා එම ඇලි ජලය එකතුවන කාණුවට සම්බන්ධ නොගැඹුරු කාණුවකට යොමු කිරීම.
- තද පස් තට්ටුව කැඩීම, පස පෙරලීම හා ගැඹුරට සී සෑම.
- දුර්වල ජලවහන තත්වයන් ඇතිවිට කෘතිම ජලවහන පද්ධතියක් සැකසීම.

### වූල් කූඩිත්තාගේ ස්වාභාවික සතුරා

## ඩයිපා බෝකර උක් බිම් වලට මුදා හරී

**දැනට ලංකාවේ උක් වගාවන්හි ස්වාභාවික ලෙස වූල් කූඩිත්තා මර්දනයෙහි යෙදෙන ඩයිපා ඇපිඩිවෝරා නමැති විලෝපික සලබයා පර්යේෂණාගාර තුළ වැඩියෙන් ඇතිකර උක් වගා බිම් වලට මුදා හැරීමට උක් පර්යේෂණ ආයතනය කටයුතු කරමින් සිටී.**

### වූල් කූඩිත්තා පාලනය සඳහා ජෛව විද්‍යාත්මක ක්‍රම


ඩයිපාට ගොදුරුවන වූල් කූඩිත්තන් .....

මෙම වැඩසටහන යටතේ උක් පර්යේෂණ ආයතනයේ පළිබෝධ පාලන අංශයේ විද්‍යාගාරයෙහි ඇති කරනු ලබන විලෝපිකයන්ගෙන් ලබා ගන්නා පිලා කෝෂ තම වගාබිම් වල විලෝපික ගහණයන් වැඩිකර ගැනීම සඳහා සෙවනගල හා පැල්වත්ත කර්මාන්තායතනයන්හි වගා අංශ වෙත සැපයීමට පියවර ගෙන ඇත. එම කර්මාන්තායතනයන්හි වගාබිම් වල වූල් කූඩිත්තාගේ ගහණය අනුව පිලාකෝෂ මුදා හැරීමට කටයුතු යොදා ඇති අතර, විලෝපික ගහණය වැඩිකර ගැනීම, ඒ සඳහා සකසා ඇති පළිබෝධකයන් සහිත දැල් කූඩු උපයෝගී කර ගෙන ක්ෂේත්‍රයන් තුළ සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් මෙම ක්‍රියා වලින් පළිබෝධ ගහණයන් සාමාන්‍යයෙන් අඩු ජූනි, ජූලි හා අගෝස්තු මාසයන්හි විලෝපික ගහණයන් පවත්වාගෙන යාමේ ගැටලු මතුව පවතින බැවින් ඒ සඳහා සුදුසු පියවර ගැනීමට පළිබෝධ මර්දන අංශය කටයුතු කරගෙන යයි.

මෙම වැඩසටහන යටතේ දැනට පිළාකෝෂ 8000 ක් පමණ පැල්වත්ත හා සෙවනගල සීනි සමාගම් සඳහා ලබා දීමට උක් පර්යේෂණ ආයතනය කටයුතු කර ඇත. මෙයට අමතරව උක් කර්මාන්තායතනයන්හි අවශ්‍යතාවයට අනුකූලව වූල් කූඩිත්තා සඳහා සුදුසු වැඩසටහන් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමටද උක් පර්යේෂණ ආයතනයේ පළිබෝධ මර්දන අංශය මගින් දැනට කටයුතු කරගෙන යනු ලැබේ.

### ගම නැගුම වැඩ සටහන යටතේ

# සියඹලාණ්ඩුව මඩුගම ප්‍රදේශයේ උක් ගොවි බිම් සංවර්ධනයට පියවර

ගම නැගුම වැඩ සටහන යටතේ සියඹලාණ්ඩුව මඩුගම ප්‍රදේශයේ උක් ගොවි බිම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ඇරඹීමට උක් පර්යේෂණ ආයතනය පියවර ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ගොවි පවුල් 50ක් පමණ හඳුනාගෙන ඇති අතර ඔවුන් ගේ ප්‍රධාන අවශ්‍යතාවයන් ලෙස හඳුනාගත් නිරෝගී බීජ උක් සපයාදීම හා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම තුලින් ගොවි බිම් සංවර්ධනයට දයකවීම මෙම වැඩසටහනේ මූලික කාර්යය වේ.

තෝරාගත් ගොවි බිම් සඳහා බීජ උක් සපයා ගැනීමට අවශ්‍ය මූලික තවාන් තුනක් සංස්ථාපනය කිරීමට දැනටමත් කටයුතු කර ඇති උක් පර්යේෂණ ආයතනයේ ව්‍යාප්ති හා පුහුණු අංශය, මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රදේශයට උචිත උක් ප්‍රභේද හා උක් සමග අතුරුබෝග භාවිතය ව්‍යාප්ත කිරීමටත් සැළසුම් කර ඇත.



උඩවලව උක් පර්යේෂණ ආයතනයට පැමිණි මඩුගම ප්‍රදේශයේ ගොවි මහතුන් ශෂ්‍ය විද්‍යා අංශය මගින් ස්ථාපිත උක් සමග අතුරු බෝග වගාවන් අධ්‍යයනය කරමින් .....

## උක් සමග අතුරු බෝග ක්ෂේත්‍ර ආදර්ශන

දැනට සමහර ගොවි මහතුන් තම උක් වගාවන් හි නොයෙකුත් අතුරු බෝග වර්ග සිටුවීමට පෙළඹී ඇතත්, එය සැළසුම් සහගතව නොකරයි. උක් වගාව සමග සිටුවීමට වඩාත් යෝග්‍ය බෝග වර්ග තෝරාගැනීමත් නිර්දේශිත වගා පිළිවෙත් අනුව ක්ෂේත්‍රයේ මෙම බෝග වර්ග [illegible] කිරීම උක් වගාව සමග කව්පි, පිපි.ඤ්ඤ, පැණි කොමඩු හා සෝයා බෝංචි ගැනීමට මූලික මග පෙන්වීමක් ලෙස උක් පර්යේෂණ ආයතනයේ නිර ගැනේ. ඒ අනුව මෙම ආදර්ශන ගොවි බිම් සඳහා අතිරේක බෝග බීජ පියවර ගෙන ඇත.

## නිර්දේශිත අතුරු බෝග

| බෝගය/ප්‍රභේදය | බීජ අවශ්‍යතාවය (හෙක්.1ට කි.ග්‍රෑ) | සිටුවන පරතරය | සිටුවන කාලය | සාමාන්‍ය අස්වැන්න හෙක්.1ට කි.ග්‍රෑම් |
|---|---|---|---|---|
| කව්පි (එම්. අයි. 35) | 22.5 | උක් පේළි දෙකක් අතර කව්පි පේළි එකයි. පැළ අතර පරතරය අඟල් 6ක් වන අතර එක් වළක පැළ 2යි. | මහ කන්නයේ මුල් සහ මැද අවධිය (සැප්තැම්බර්/ඔක්තෝම්බර් හෝ මුල් යල වැසි සමග (මාර්තු) | 350 |
| මුං (එම්. අයි. 5) | 15 | උක් පේළි දෙකක් අතර මුං පේළි එකයි. මුං පැළ අතර පරතරය අඟල් 4ක් වන අතර,එක් වළක පැළ 2 හෝ උක් පේළි දෙකක් අතර මුං පේළි දෙකයි.පේළි අතර පරතරය අඩි 1යි සහ මුං පැළ අතර පරතරය අඟල' 4ක් වන අතර එක් වළක පැළ 1යි. | - එම - | 250 |
| උඳු (එම්. අයි. 1 | 15 | ඉහත ආකාරයටම | - එම - | 370 |
| රටකජු (තිස්ස) | 50 | උක් පේළි දෙකක් අතර රටකජු පේළි එකයි.රටකජු පැළ අතර පරතරය අඟල්4ක් වන අතර එක් වළක පැළ 1යි. | - එම - | 1,000 |
| තල | 3.3 | උක් පේළි දෙකක් අතර තල පේළි එකයි.තල පැළ අතර පරතරය අඟල් 4ක් වන අතර එක් වළක පැළ 2යි. | - එම - | 65 |
| පැණි කොමඩු (තිළිණි) | 0.4 | උක් පේළි දෙකක් අතර පැණි කොමඩු පේළි එකයි. පැණි කොමඩු පැළ අතර පරතරය අඩි 3.3ක් වන අතර එක් වළක පැළ 1යි. | මහ කන්නයේ මුල් සහ මැද අවධිය (සැප්තැම්බර් /ඔක්තෝම්බර්) අනෙකුත් මාසවල නම් වාරි ජලයෙන් | 6,000 |
| පිපිඤ්ඤ (එල්. වයි. 56 හා එල්. ඩබ්ලිව්. 56 ) | 0.4 | උක් පේළි දෙකක් අතර පිපිඤ්ඤ පේළි එකයි. පිපිඤ්ඤ පැල අතර පරතරය අඩි 4ක් වන අතර එක් වළක පැළ 1යි. | - එම - | 7,000 |

## ආයතන තො

### ප්‍රධාන පර්යේෂණ නි දිවියෙන් සමුගනී

පසුගිය දශක දෙකකට වෙනුවෙන් දායක වූ උක් ලෙස ද කටයුතු කරමින් මහතාගේ අකල් වියෝ දී පර්යේෂණ නිළධාරි සේවයට එක් වූ සෙනෙ 2003 දී ප්‍රධාන පර්යේෂ පළිබෝධ පාලන විෂයෙ වගාවේ සුදු පත්‍ර රෝග උක් වගාවට [illegible]ල ත ලබා දෙමින් කටයුතු ක කර්මාන්තයටත් පොදු

### සෙවනගල ක්ෂේත්‍ර සාර්ථකව අවසන්









ක් ඉඩමෙන් ලැබෙන ආදායම උපරිම කරගත හැකිය. එබැවින්
බෝග ලෙස යොදා ගැනීමෙන් වගා බිම් උපරිම ප්‍රතිලාභ අයත් කර
වගා පාලන ක්‍රම ආදර්ශනය කිරීමට දැනට ස්ථාපිත වගාබිම් යොදා
හාර හා අවශ්‍ය රසායනික වල් පැළෑටි නාශක නොමිළේ ලබා දීමට

## ුරු

### රි ආචාර්ය ජේ.ඒ.යූ.ටී. සෙනෙවිරත්න මහතා



ීන කාළයක් පුරා දේශීය උක් කර්මාන්ත සංවර්ධනය
ේෂණ ආයතනයේ පළිබෝධ පාලන අංශයේ අංශ ප්‍රධානී
ප්‍රධාන පර්යේෂණ නිළධාරී ආචාර්ය ජේ.ඒ.යූ.ටී. සෙනෙවිරත්න
ඳ කනගාටුදායක පුවත අප මෙසේ සටහන් කරන්නෙමු. 1990
ලස උක් පර්යේෂණ ආයතනයේ පළිබෝධ පාලන අංශයේ
මහතා 1998 දී ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරී තනතුරටත්
ප්‍රධාරී තනතුරටත් පත්විය. විවිධාකාරයෙන් උක් කර්මාන්තයේ
තිය වෙනුවෙන් කැපවූ ඒ මහතාගේ සේවය ඇගයීමට උක්
කෘමි විශේෂය හඳුනා ගැනීමට දැක්වූ උත්සාහය හා කැපකිරීමම ප්‍රමාණවත් වේ.
පවතින වූල් කූඩිත්තා කෘමි වසංගතය පාලනය උදෙසා සිය උපරිම කැපවීම
මොහොතක මෙසේ වියෝ වී යාම උක් පර්යේෂණ ආයතනයටත් උක්
පිරිමැසිය නොහැකි පාඩුවකි.

### රීන් උක් වගාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව



ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ ඉල්ලීමක් මත උක් පර්යේෂණ ආයතනය මගින් සෙවනගල සීනි සමාගමේ ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා පැවැත්වූ මාස 6ක උක් වගාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 2008 මාර්තු 08 දින දක්වා සෙවනගල උක් සමාගම් පරිශ්‍රය තුල පැවැත් වූ අතර මෙම පාඨමාලාව මගින් උක් අභිජනනය, උක් බෝග කළමණාකරණය, රෝග හා පළිබෝධ කලමණාකරනය, පාංශු හා ජල කළමනාකරනය, උක් වගාවේ යාන්ත්‍රීකරනය, සීනි නිෂ්පාදනය හා අතුරුඵල, උක් වගාව හා ආශ්‍රිත ආර්ථික කරුණු, පිරිස් කළමණාකරනය, ජෛව මිතිය හා කෘෂි කාර්මික ව්‍යාප්ති අධ්‍යයනය යන මූලික විෂය කරුණු ආවරණය කරන ලදී. මේ සඳහා සෙවනගල සීනි සමාගමේ ක්ෂේත්‍ර නිළධාරී මහත්ම මහත්මීන් 22 දෙනෙක් සහභාගී විය.

පාඨමාලාවට සහභාගී වූ ක්ෂේත්‍ර නිළධාරී මහතුන් සෙවනගල සීනි සමාගමේ වගා කළමණාකාරතුමා හා පාඨමාලාව සඳහා සම්පත් දායකත්වය ලබා දුන් උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂකතුමා ඇතුළු කාර්ය මණ්ඩලය සමග...

### උක් පර්යේෂණ ආයතනයේ නව උපදෙස් පත්‍රිකා

පහත මාතෘකා යටතේ ඇති පත්‍රිකා මුද්‍රණය කර උක් කර්මාන්තායතන, ගොවි මහතුන් හා උක් වගා කටයුතු සම්බන්ධව උනන්දුවක් දක්වන අය සඳහා ලබා දීමට උක් පර්යේෂණ ආයතනීය ව්‍යාප්ති හා පුහුණු අංශය පියවර ගෙන ඇත.

1. උක් වගාව සමග අතුරු බෝග වගා කිරීම
2. මැද රට අන්තර් මධ්‍ය කළාපයෙහි උක් වගා කිරීම සඳහා මග පෙන්වීමක්
3. උක් නිරි වගා පාලනය



# නව උක් ප්‍රභේද පැල්වත්තේ ගොවි බිම් තුළට

උක් අභිජනන වැඩසටහන යටතේ ඉදිරියේදී හඳුන්වාදීම සඳහා යෝග්‍ය බවට හඳුනාගෙන ඇති SL 92-5588 ප්‍රභේදය ගොවි මහතුන් ගේ කළමණාකරනය යටතේ පැල්වත්ත ප්‍රදේශයේ තෝරා ගත් ගොවි බිම් වල අධ්‍යනයට ලක්කිරීමට උක් පර්යේෂණ ආයතනය පියවර ගෙන ඇත. පැල්වත්ත සීනි සමාගමේ ශෂ්‍ය විද්‍යා අංශයේ සහය ඇතිව උක් පර්යේෂණ ආයතනයේ, ශෂ්‍ය විද්‍යා, පළිබෝධ පාලන, ක්ෂුද්‍ර ජීව විද්‍යා, රසායන විද්‍යා හා ව්‍යාප්ති අංශය, උක් අභිජනන අංශයේ මූලිකත්වයෙන් උචිත නව ප්‍රභේද හඳුනා ගැනීමේ පර්යේෂණයක් ලෙස මෙම අධ්‍යයනය මෙහෙයවයි. වර්ෂා පෝෂිත තත්ව යටතේ වගා කරන හෙ. 1 ප්‍රමාණයේ වගා බිම් 5 ක් මේ සඳහා යොදා ගෙන ඇති අතර දැනට පැල්වත්ත ප්‍රදේශයේ බහුල ලෙස වගා කරනු ලබන M 438-59 ප්‍රභේදය හා සමව නව ප්‍රභේදය වගා කර සමාන කළමනාකරණ තත්ව යටතේ M 438-59 ප්‍රභේදය හා සංසන්දනාත්මකව නව ප්‍රභේදයේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කරයි. මෙම අධ්‍යයනයන්හි ප්‍රතිඵල මත අවශ්‍ය නිර්දේශ සමග මෙම වර්ගය ඉදිරියේදී හඳුන්වා දීමට උක් පර්යේෂණ ආයතනය සැලසුම් කර ඇත.

# සීනි නිෂ්පාදනය පිළිබඳ වර්ථමාන තොරතුරු

## සෙවනගල සීනි කර්මාන්තායතනයේ උක් වගා දත්ත 2006/2007

උක් වගාකල බිම් ප්‍රමාණය (හෙක්ටයාර)

| | |
|---|---|
| වාරි පෝෂිත | 1648 |
| වර්ෂා පෝෂිත | 2,110 |
| පිටස්තර ගොවි | 153 |

ඇඹරූ උක් ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)

| | |
|---|---|
| වාරි පෝෂිත | 115,855 |
| වර්ෂා පෝෂිත | 108,332 |
| පිටස්තර ගොවි | 4424 |

මුළු උක් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) 228,612

සීනි නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) 18,651

සීනි උකහා ගැනීම (%)

8.09

මුළු ඉක්ෂුපාක නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)

11593

### දේශීය සීනි නිෂ්පාදනය, සීනි ආනයන ප්‍රමාන ආනයන වියදම හා ඒක පුද්ගල සීනි පරිභෝජනය

| අවුරුද්ද | දේශීය නිෂ්. (මෙ.ටො.) | ආනයන ප්‍රමාණය(මෙ.ටො) | ආනයන වියදම (රු. මිලියන) | ඒක පුද්ගල පරිභෝජනය (කි.ග්) |
|---|---|---|---|---|
| 2001 | 48000 | 420000 | 10289 | 33.18 |
| 2002 | 38000 | 554000 | 12634 | 31.12 |
| 2003 | 57000 | 509000 | 11199 | 34.82 |
| 2004 | 58000 | 438000 | 11048 | 35.12 |
| 2005 | 54000 | 418000 | 13303 | - |
| 2006 | 56000 | 525000 | 23256 | - |
| 2007 | 32000 | 481000 | 17055 | - |

(දත්ත මූලාශ්‍රයන් : ශ්‍රී ලංකා මහා බැංකු වාර්තා,F.O.Lichts statistics, සෙවනගල හා පැල්වත්ත උක් කර්මාන්තායතන)

### ශ්‍රී ලංකාවට සීනි ආනයනය (2006 මාර්තු - 2007 පෙබරවා

| ආනයනය කළ රට | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| පිරිසිදු නොකළ සීනි | 9465 |
| තායිලන්තය | 5250 |
| යුරෝපා කොමිසම | 1501 |
| සිංගප්පූරුව | 1165 |
| හොංකොං | 1000 |
| ස්විස්ටර්ලන්තය | 500 |
| වෙනත් | 49 |
| සුදු සීනි | 503687 |
| යුරෝපා කොමිසම | 203924 |
| ඉන්දියාව | 80490 |
| ස්විස්ටර්ලන්තය | 71121 |
| බ්‍රසීලය | 60713 |
| සිංගප්පූරුව | 43453 |
| තායිලන්තය | 27902 |
| අනෙකුත් රටවල් | 16084 |

(දත්ත මූලාශ්‍රයන් F.O.Licht,s International sugar and sweetener report 2008)

# ජාන තාක්ෂණයේ දියුණුව තුළින් උක් ගස ජෛව කම්හලක් බවට ...

**ඕස්ට්‍රේලියාව ජෛව ප්ලාස්ටික් නිපදවීමට හා ඇමෙරිකාව ඖෂධ සඳහා අවශ්‍ය ප්‍රෝටීන නිපදවීම සඳහා උක් ශාඛයේ අවශ්‍ය ජාන වෙනස් කිරීම් සාර්ථකව සිදු කරමින් මෙතෙක් වල් පැලෑටි නාශක හා පළිබෝධ ප්‍රතිරෝධී උක් ශාඛ නිපදවීමේ ක්‍රියාදාමයට සීමා වෙමින් තිබූ ජාන තාක්ෂණය ඉන් ඔබ්බට ගෙන යාමේ නව මං විවෘත කර ඇත. මෙම සංවර්ධනයන් සමග ජාන තාක්ෂණයේ දියුණුව යොදා ගනිමින් ශාක ජෛව නිෂ්පාදනාගාරයන් බවට හැරවීම උදෙසා පර්යේෂණ මෙහෙයවන ලොව පුරා රටවල් ගණනාවක විද්‍යාඥයන් උක් ගස කෙරෙහි පලකල විශේෂ අවධානය තව තවත් ඉහළ නැංවෙන්නට පටන්ගෙන ඇත.**

ජාන තාක්ෂණය උක් වගාවේ සංවර්ධනයට යොදා ගැනීම උදෙසා කටයුතු කරන ඕස්ට්‍රේලියාව, බ්‍රසීලය ඇ.එ.ජ. මුරිසිය, ද.අප්‍රිකාව ආදී රටවල පර්යේෂණ ආයතන මේ වන විට ද ක්ෂේත්‍ර ගණනාවකින් කැපී පෙනෙන ප්‍රතිඵල අයත් කර ගනිමින් සිටී. එසේම මෙම ආයතන වල විද්‍යාඥයින් උක් ශාකයට අදාළව ජාන තාක්ෂණය විවිධ මං පෙත් ඔස්සේ සංවර්ධනය කරමින් දිනෙන් දින අප තුළ නව බලාපොරොත්තු ඇති කරවයි. ඔවුන් ලබා ඇති ප්‍රගතිය අතුරින් 2007 වසරේ දී ඕස්ට්‍රේලියාවේ පර්යේෂකයන් දෙපොළක් සුක්‍රෝස් වලට අමතරව, සුක්‍රෝස් නොවන සීනි වර්ගයක් වන අයිසොමැල්ටුයුලෝස් නිපදවිය හැකි උක් ශාකයක් නිපදවා ඇති ආකාරය මේ ක්ෂේත්‍රය කෙරෙහි වූ බලාපොරොත්තු ඉහළ නැංවෙන අයුරු විදහා පාන තවත් එක් අපූර්ව අවස්ථාවකි. මෙමගින් සාමාන්‍ය ශාකයකට වඩා දෙගුණයක් සීනි නිපදවීමට හැකි අතර එහි ඇති අයිසොමැල්ටුයුලෝස් මධ්‍යසාර නිපදවීමට යොදා ගත හැකි වීම ජෛව ඉන්ධනයන් පසු පස හඹා යාමට පටන් ගෙන ඇති ලෝකයට නව මං පෙත් පෙන්වීමක් නොවේද?

ජාන ඉංජිනේරු විද්‍යාව මගින්, පවතින ඉහළ ගුණාංග සහිත ශාක ප්‍රභේද වලට ප්‍රතිරෝධී ජාන හඳුන්වාදීමේ දී මුහුණ දුන් ගැටලු වලට වඩාත් ප්‍රායෝගික විසඳුමක් සපයා ඇත. මේ මගින් ශාක මුහුම් වීමේදී නැවත ජාන එකට සංයෝජනය වීම වලක්වමින් පවතින ඉහළ ගුණාංග සහිත ප්‍රභේද වලට ප්‍රතිරෝධී ජාන හඳුන්වාදීම පහසු කරයි; නව ප්‍රභේදයක් ලබා ගැනීම සඳහා දරන්නට වන වියදම හා ගත වන කාළය අඩු කරයි. එසේම විශේෂයේ ස්වාභාවික ජාන ප්ලාස්මය තුළ හිඟ ශෂ්‍ය විද්‍යාත්මකව වැදගත් වන ලක්ෂණ ජෙනෝමයට හඳුන්වාදීමට ජාන තාක්ෂණය අවස්ථාව සපයයි.

ලොව පුරා බොහෝ විද්‍යාඥයින් උක් ගස ජෛව කම්හලක් බවට පත්කිරීම කෙරෙහි නැඹුරු වීමට බලපෑ උක්ගස සතු විශේෂ ලක්ෂණ බොහෝය. හිරු එළිය අවශෝෂණය හා භාවිතා කිරීමේ ඉහල කාර්යක්ෂමතාව හේතුවෙන් විශාල ලෙස කාබන් ගබඩා කිරීමට හැකිවීම, වැඩි ජෛව පදාර්ථ නිෂ්පාදනය, සම්ප්‍රදායික ශෂ්‍යවිද්‍යාත්මක ක්‍රියාකාරකම් සහ අවුරුදු 3-4කට වරක් සිටුවීම, වගා කිරීමට පහසු ශක්තිමත් ශාකයක් වීම, ආහාරයක් ලෙස සෘජු පරිභෝජනය සඳහා නොගැනීම, අවුරුදු 10කට වැඩි කාලයක සිට ජාන තාක්ෂණ අධ්‍යයනයන්ට යොදගෙන තිබීම හා කායික විද්‍යාත්මක , ශෂ්‍ය විද්‍යාත්මක හා ලෙඩ රෝග පිළිබඳව අවශ්‍ය දැනුම සංවර්ධනය වී තිබීම, මල් හට නොගන්නා ප්‍රභේද ඇති නිසා ස්වයං අනවශ්‍ය මුහුම්වීම් වැලකීම, ස්වයංව සුළඟ මඟින් ලිංගික බීජ ගෙන ගොස් ප්‍රජනනය කිරීමේ හැකියාවක් නොමැතිවීම, සංයෝග නිස්සාරනය සඳහා වූ කාර්මික ක්‍රියාවලියක් හොඳින් ස්ථාපිත වී තිබීම, හා අනෙකුත් තෘණ ශාක වලින් වෙනස්ව බොහෝ උක් ප්‍රභේද පටක රෝපන (in-vitro) තත්වයතුල පැල වර්ධනය වන කැළස නිපදවීම ආදී ය උක් ශාකය සතු ජාන තාක්ෂණයට හිතකර ලක්ෂණ වේ.

**විවිධ රටවල උක් ප්‍රභේද තුලට ඇතුලත් කර ඇති හා ඇතුලත් කිරීමට අධ්‍යයනය කරන ලක්ෂණ**

| ජාන භුවමාරුවට අදළ ලක්ෂණය | රටවල් |
|---|---|
| **වල් පැලෑටි නාශක වලට ඔරොත්තු දීම** | |
| ග්ලූෆසිනේට් | ඕස්ට්‍රේලියා, බ්‍රසීලය, ඇ.එ.ජ., මුරුසිය, ද.අප්‍රිකාව |
| ග්ලයිපොසේට් | බ්‍රසීලය, ඇ.එ.ජ., ද.අප්‍රිකාව |
| ඉමිඩසොලිනොන් | බ්‍රසීලය. |
| **පළිබෝධ ප්‍රතිරෝධීතාව** | |
| බැසිලස් තුරෙයිජෙන්සිස් meiated | බ්‍රසීලය, ද.අප්‍රිකාව |
| Proteinase inhibitors | බ්‍රසීලය, ද.අප්‍රිකාව |
| **රෝග වලට ප්‍රතිරෝධීතාව** | |
| ශල්ක පත්‍ර ප්‍රධාහය | ඕස්ට්‍රේලියා, බ්‍රසීලය |
| SCMV | ඕස්ට්‍රේලියා, බ්‍රසීලය, ඇ.එ.ජ., ද.අප්‍රිකාව |
| SYLV | බ්‍රසීලය, කොලොම්බියාව, ඇ.එ.ජ. |
| SrMV | ඇ.එ.ජ. |
| RSD | ඇ.එ.ජ. |
| Fiji Leaf Gall | ඕස්ට්‍රේලියා |
| **ජෛවීය නොවන ක්ෂේත්‍ර පීඩා තත්ව ප්‍රතිරෝධීතාව** | |
| ජල හිඟතාව(නියගය) | බ්‍රසීලය, මුරුසිය |
| අධු උෂ්ණ තත්වය | බ්‍රසීලය, මුරුසිය |
| ලවණ අධිකතාව | මුරුසිය |
| **වෙනත්** | |
| කාබෝහයිඩ්‍රේට පරිවෘතිය | ඕස්ට්‍රේලියා, ඇ.එ.ජ. |
| මල් පිපීම පාලනය | බ්‍රසීලය |
| ඖෂධමය එන්සයිම | ඇ.එ.ජ. |
| Biodegradable plastics | ඕස්ට්‍රේලියා |

Sugar Journal 2008 අප්‍රේල් කලාපයේ Andrea Maldonado Ph.D., Mario Melgar, Ph.D and Philip Lamport, M.B.A විසින් සම්පාදිත ලිපියක් ඇසුරිනි- සංස්කාරක පුවත් හසුන.

දැනට ලොව පුරා ජාන තාක්ෂණය තුලින් බෝග වැඩි දියුණු කිරීම කෙරෙහි විවිධ මත ගැටුම් පැවැතියත් ජාන තාක්ෂණයෙන් වැඩි දියුණු කල සමහර බෝග (බැසිලස් තුරෙන්ජෙන්සිස් පරිණාමනය කළ) භාවිතා වී ඇති වේගය: 1996 දී පැවැති හෙක්ටයාර මිලියන දෙක 2004 දී හෙක්ටයාර මිලියන 47 ක් බවටත් 2006 දී එය හෙක්ටයාර මිලියන 110 ක් බවට පත්ව ඇත. ඒ අනුව ඉදිරියේ මෙම තාක්ෂණයන් යොදගැනීම ලෝකය පුරා වෙළඳ පොළ නිෂ්පාදන වල තරඟකාරීත්වය තීරණය වන ප්‍රධාන සාධකයක් වනු ඇත. උක් ශාකයට අදලව විවිධ මං පෙත් කරා ජාන තාක්ෂණය යොමුවන ආකාරය දෙස බලන විට උක් ගස ජෛව කම්හළක් බවට පත් කිරීමටත් එමගින් වෙළඳ පොළ තුළ තරඟකාරීව හැසිරීමටත් ජාන තාක්ෂණයේ ප්‍රවර්ධනයන් උක් කර්මාන්තයට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

# වූල් කූඩිත්තාගෙන් හානි වූ පස්සර ගොවි බිම් යළි සංවර්ධනය වේ.

2005 වසරේ දී වූල් කූඩිත්තා කෘමි හානිය හේතුවෙන් විනාශයට පත් වූ පස්සර ප්‍රදේශයේ කහටරුප්ප හා පාලාවත්ත ග්‍රාමසේවා වසම් වල උක් වගා බිම් නැවත සංවර්ධනය කිරීමේ කටයුතු ඇරඹීමට උක් පර්යේෂණ ආයතනයේ සහාය මත ප්‍රදේශයේ ගොවි මහතුන් මේ වන විට සමත්ව ඇත. කෘමි හානිය හේතුවෙන් වසර දෙකක් පමණ සම්පූර්ණයෙන්ම අත හැර දමන ලද මෙම වගා බිම් සංවර්ධනයට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරන ලද උක් පර්යේෂණ ආයතනීය ව්‍යාප්ති හා පුහුණු අංශය, අවශ්‍ය බීජ උක්, පොහොර, කෘෂි රසායන හා තාක්ෂණික උපදෙස් ලබා දෙමින් බීජ උක් නිෂ්පාදනය කිරීම සඳහා තෝරාගත්



වගා බිමට බීජ උක් රැගෙන යන ගොවි මහතුන් .....

උක් ගොවි බිම් ස්ථාපනය කිරීමට පියවර ගෙන ඇත.



දැනට අක්කර 10 ක් පමණ මූලික තවාන් ලෙස සංවර්ධනය කර ඇති අතර, මෙමගින් අනෙකුත් ගොවි බිම් සංවර්ධනය සඳහා අවශ්‍ය බීජ උක් සපයා ගැනීමට සැළසුම් කර ඇත. ඉතාමත් දුෂ්කර තත්ව යටතේ අවම සේවා පහසුකම් ලබමින් සිය උක් වගාවන් පවත්වාගෙන යන මෙම ප්‍රදේශයේ උක් ගොවි මහතුන් සාම්ප්‍රදායික වගා පාලන ක්‍රම භාවිතයට හුරුව ඇති අතර, තම අස්වනු උක් පැණි හා හකුරු නිෂ්පාදනය සඳහා භාවිතා කරයි. එබැවින්, වල ක්‍රමයට උචිත වගා පාලන නිර්දේශ පිළිබඳව මෙම ගොවි ජනතාවට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීමට කටයුතු කර නිෂ්පාදකතාව වැඩි කිරීමටත් උක් පැණි හා හකුරු දීමටත් මෙම වැඩසටහන



වල ක්‍රමයට උක් දඬු සිටුවමින් .....

නිෂ්පාදනය පිළිබඳව අවශ්‍ය තාක්ෂණික මඟ පෙන්වීම් ලබා



උක් කර්මාන්තයට අදාළ ලිපි සැපයීමෙන් පුවත් හසුන ඉදිරි කලාපයන් සඳහා ඔබටද දායක විය හැකි අතර එම ලිපි ලේඛන සහ ඔබගේ අදහස් සහ යෝජනා පහත ලිපිනයට යොමු කරන්න.


සංස්කාරක
පුවත් හසුන
උක් පර්යේෂණ ආයතනය
උඩවලව

දු.ක. 047 2233283, 2233285
ෆැක්ස්. 047 2233233
විද්‍යුත් තැපෑල sri@bellmail.lk
වෙබ් අඩවිය www.sugarres.gov.lk



**විෂය උපදේශකත්වය**

ආචාර්ය සී.එස්.වීරරත්න
ආචාර්ය එච්.කේ.සුනිල්
ආචාර්ය එන්.සී.කුමාරසිංහ
අරුණ විජේසූරිය මහතා
ආචාර්ය ඩබ්.ආර්.ජී.විතාරම
එම්.එස්.පෙරේරා මහතා
කේ.ඒ.ඩී.කොඩිතුවක්කු
එන්.එස්.අබේසිංහ මහතා
ඩබ්.එන්.ඩී.කුමාරි මෙනවිය
කේ.එච්.ඩී.අබේරත්න මහතා

**සංස්කරණය සහ පිටු සැකසුම**

එම්.එස්.පෙරේරා

RGW Creations_ 0714 200 747